

Nick Clegg
Liberal Democrat Leader



David Cameron
Conservative Party Leader



Prime Minister Gordon Brown
Labour Party Leader

## බ්‍රිතාන්‍ය දේශපාලනයේ අද මුහුණුවර

# මේ මුහුණු දෙස බලා සාස්තරයක් කියමුද?

**ශා**ස්ත්‍ර (සාත්තර) හෝ ඵලාපල කීමෙහි දී බොහෝ නක්ෂත්‍රකරුවන්ද පේන කියන්නන්ද නිමිති අල්ලන්නන්ද කෙළින්ම බලන්නේ තමා ඉදිරියේ සිටින පුද්ගලයාගේ මුහුණ දිහා ය. තමන්ට ඇති පළ පුරුද්ද තුළින් පුද්ගලයින්ගේ මුහුණේ ස්වභාවය අනුව ඔහු දැනට පත්ව සිටින තත්වය ගැන කිසිවක් සොයාගත හැකි ය. ඒ සොයාගත් කරුණු තමන්ට ආවේණික භාෂා ශෛලියෙන් අසන්නාට කීවිට "කොහොමද බලන් හිටියා වගේ මට වෙලා තියෙන දේ කිව්වේ ?" කියා අසන්නා පුදුම යෙනුත් පුදුමයට පත්වන්නේය. එක කරුණක් යාන්තමට හෝ හරිනම් සාස්තරකරු කී ඉතිරි සියළු දේ හරි ය. මෙය ලෝකයේ කොතනත් සිදුවන දෙයකි.

අපේ සාස්තරකරුවෙක් ඉහතකී මුහුණු තුන දැක්කා නම් මේ විදියට කියනවා නිසැකය. දකුණු කෙළවරේ සිටින අගමැති ගෝඩ්න් බ්‍රවුන් දිහා බැලුවොත් මෙසේ ය.

" මහත්තෙයෝ කිව්වට තරහ වෙන්න එපා. මේ යන්නෙ මහා නරක කාලයක්. සෙනසුරු ඒරාෂ්ඨකේ. උන්හිටි තැන් නැති වෙන්න ඕන... ඉන්න ගෙදරින් දොට්ට වැටෙන්න ඕන.... රස්සාව ගහලා යනවා.... හතුරු කරදර අනන්තයි.... දැනට යාන වාහන ගරු නම්බු බැබලීම තියනව නම් ඒ සේරම හතුරෝ උදුරගන්නවා.... නිකම්ම මිනිස්සුන්ට පජ්ජවෙනවා... පරිස්සම් වෙන්න...."

සාස්තරකාරයා මෙතන මැද ඉන්න ඩේවිඩ් කැමරන්ට කියන්නේ මේ විදියට ය.

" මහත්තෙයො මම එකක් කියන්නම්..... මේ මහත්තෙයගෙ පක්ෂියා රජ කරන වෙලාව හරිද...? මේ වෙලාවට මහත්තෙයො වැල්ලෙ ගැහුවත් බඹරෙ කර කැවෙනවා.... මහත්තෙයගෙ හඳහනේ අහහරු නීචවෙලා... ගුරු උච්චවෙලා... ඒ එක්කම කේතු හතට ගිය නිසා තිබ්බ්ච බාධා කරදර සේරම අහවරයි... බය නැතුව අත ගහන්න ඕනම දේකට... ලොකු ධානාන්තර එන්න පුළුවන්.... රාජ යෝගයක් මෙතන තියෙන්නෙ... හතුරෝ පවා මහත්තෙයා ළඟ දණගහන කාලයක්.... මහ රැජින පවා ළඟදි අඩ ගහන්න පුළුවන්... ගන්න මහත්තෙයො බය නැතුව සුවීප් ටිකට් එකක්... අම්මපා අදෙනවාමයි.... ඇදුණොත් ඉතින් අපිටත් කීයක් හරි දෙන්න...."

වම් කෙළවරේ සිටින ලිබ් ඩෙම් පාටියේ නික් ක්ලෙග් අපේ සාස්තරකාට අහුවුනොත් මෙසේ විය හැකි ය.

" මහත්තෙයට කිසි දෙයක් හෙප්පුවෙ තියලා මෙන්න කියලා නිකං හම්බවෙන්නෙ නැහැ.... මහත්තෙයා හැම දේටම මහන්සි වෙන්න ඕන.... හැබැයි අවශ්‍ය දේ හම්බවෙනවා.... මෙතන අඟහරු අටේ ඉන්න නිසා රවීට තුන්වෙනි ස්ථානයත් පේන නිසා හොඳ තත්වයක් ළඟදි එන්න තියනවා.... දේසපාලනේ කරන කෙනෙකුට නම් නියම වෙලාව.... ඇමති පට්ටමක් ෂුවර්.... සාකච්ඡාවලට ගියොත් පරිස්සම් වෙන්න.... වැරදි වචන කියලා තියන චාන්ස් එක කාගන්න එපා...."

මේ වන විටත් ප්‍රධාන පක්ෂ තුනට තීරණයකට එන්න බැරුව ඇත. ගෝඩ්න් බ්‍රවුන් තවමත් අගමැති ය.

♦ වෙනුර

## According to MAYAN PREDICTIONS 2012 is the End of the World !

# ලෝකයේ අවසානය 2012 දී ද?

2009 December 21st marked the countdown to what ancient prophecies term "the end of time", which many interpret to mean the end of the world - or at least, the end of the world as we know it. While there is much speculation and predictions regarding the events that will actually transpire, the impending end of the Mayan Calendar is building a momentum among the masses similar to the dreaded anticipation that we witnessed as the world approached the milestone year 2000

The current economic chaos and global meltdown may be precursors to the transition leading up to December 21, 2012, the day that the 5,125 year-old Mayan calendar suddenly comes to an end, resetting to 0.0.0.0. But what will be the catalyst? Some believe we will experience a polar shift, as has happened on Earth before. Others predict the impact of a great meteor or asteroid, which has also catastrophically occurred before.

Or could it be the result of increasing global warming, or the extinction of too many species, or could it be global Armageddon brought on by man's incessant greed triggering war and destruction? Whatever the cause, in the two years leading up to this imminent global endtime, there must be some hope. Is it possible that ancient civilizations may have left us clues for our survival?

**මේ** පෘථිවිය මත අවුරුදු දහස් ගණනකට පෙර බිහිවූ මායා ශිෂ්ඨාචාරයට අනුව **2012** වසරේ දී මේ ලෝකයේ අවසානය සිදුවීමට නියමිතය. මායන් කැලැන්ඩරයට අනුව ලෝකය **2012** දී මුල පටන් ගත් බිංදුවට යළි පැමිණීම සිදු වේ. යළිත් ලෝකයේ පටන්ගැන්ම එතැන් සිටය. මෙය විය හැකි දෙයක්ද?

එහෙත් මායාවරුන් යනු අතීතයේ විසූ අතිශය බුද්ධිමත් පිරිසකි. දකුණු ඇමරිකාව ආශ්‍රිත ප්‍රදේශවල විසූ ඔවුන් තාරකා ශාස්ත්‍රය, ගණිත විද්‍යාව, වෛද්‍ය විද්‍යාව අද අපට හුරු නවීන විද්‍යාවට සම්බන්ධ බොහෝ දේ ප්‍රගුණ කර සිටි ජාතියකි. ඒ නිසා මේ අනාවැකි සත්‍ය බව බොහෝ අයගේ විශ්වාසයයි.

දැනට උද්ගතව ඇති ආර්ථික අර්බුදය, ලෝකයේ උෂ්ණත්වය ඉහළ නැගීම, සුනාමි, ගිනිකඳු පිපිරීම, අයිස් කඳු පවා ගිනිගෙන දෙදරා යාම, සතුන් හා මත්ස්‍යයින් වර්ග මැරී වඳවීයාම, ලොවපුරා ත්‍රස්තවාදය ආදිය මේ විනාශය දනවන පෙර නිමිති බව ඇතැම් අයගේ විශ්වාසයයි. ලෝකයේ අවසානය **2012** දීය යන මායානු අනාවැකිය ඉවත දැමිය නොහැකි යයි ඔව්හු පෙන්නා දෙති.

එහෙත් එතරම් බුද්ධිමතුන් වූ මායන්වරු **2012** ලෝක විනාශයක් වන්නේ නම් එය වළක්වාගන්නේ කෙසේද යන්න ගැනත් හෙළිකරන්නට ඇතුවා නිසැකයයිද, එය සොයාගැන්ම මෙහිදී එකම පිළියම බව ද සමහරුන්ගේ මතයයි.

# පැරිස් පුරවරය නැළැවූ සිංහල නාට්‍ය ගී සැඳෑව

**එ**ය අපේ හද ගැස්මේ රාවය කෘතිමව මවන්නාවූ විද්‍යුත් නාද රටාවක් නොවීය. හාර්මෝලනියම් වාදනය හා බෙරහඬ පමණක් යොදා ගනිමින් සුළු කාල වකවානුවක් තුළ ඉමහත් වෙර වෑයමක් දරා ප්‍රගුණ කළ ගායක මඬුල්ලකින් සැදුම් ලත් නාඩගම්, නූර්ති හා වේදිකා නාට්‍ය ජවනිකා මියුරු ගායනාවන්ගෙන් සමන්විතව ගෙන ආ පිරිපුන් ප්‍රසංගයක් පසුගිය දා පැරිස් නුවර බැංකෙඩාලේ ශාලාවේ පැවැත්වුණේය.

පුරා වසර ශතකයටත් වඩා අප හෘදය සංවේදිවූ, හුදකලාවේදී අප නිතර මිමිණූ ජෝන්ද සිල්වා, චාල්ස් ගුණසිංහ, පී. ටී. ඩී. ප්‍රේමචන්ද්‍ර, චාල්ස් ඩයස් ආදී විද්වත් කලා ප්‍රවීනයින්ගේ සිරිසඟබෝ, රාමායන, කුණ්ඩලකේසී ආදී නිර්මාණයන් මෙන්ම මහැදුරු සරච්චන්ද්‍ර, ගුණසේන ගලප්පත්ති, මහගම සේකර වන් වියතුන්ගේ සුන්දර නාට්‍ය ගීතයන්ද අපේ මතකයන් අවදිකරමින් එම සැන්දෑව අපට ගෙන ආවේය.

සිය හිමියන් රාජ්‍ය දූත මෙහෙවරෙහි සිටින නිසා දැනට ප්‍රංශයේ වෙසෙන ප්‍රවීන කලා ශිල්පිණී, එමෙන්ම ළමා නාට්‍යකරණයේ පුරෝගාමී සෝමලතා සුබසිංහ මහත්මියත්, එතුමියගේ විශිෂ්ඨ ගෝලබාලයින් අතර කැපී පෙනෙන නිවේදිකා දීපිකා කොඩිකාර, ගත්කතුවර ආනන්ද මාපටුන ආදී කලාකාමීන් තම ගුරුමාතාවට නිකම්ම ඉන්නට නොදී වැඩක් ගන්නා නියාවෙන් මෙන් ඇයගේ කැපවීම යටතේ දැඩි ශික්ෂණයෙන් යුතුව පුහුණුව ලබා, මෙම ප්‍රසංගය වේදිකාවට පැමිණි අයුරු කදිමය. එසේම එම ගෝලබාලයින් අතින් සිය ගුරුමාතා සුබසිංහ මහත්මියට සම්මාන පුදසත්කාර ද පිරිනැමීම ඒ අවස්ථාවේ තවත් විශේෂත්වයක් වීය.

පැරිස් බෞද්ධ විහාරයේ දහම් පාසැල් ශාලාව පෙර පුහුණු කටයුතු සඳහා වෙන්කරමින් විහාරාධිපති කෝ. ආනන්ද හිමියන් සති ගණනාවක් පුරා ගායනා ශිල්පි ශිල්පිණියන්ගේ හඬ මෙන්ම සෝෂාකාරී බවද ඉවසා වදාරා සිටියේ උන්වහන්සේද හෙළ කලාව ඉහළින් අගය කරන්නෙන් අදක ඊයේක නොවන නිසාය.

♦ අමර ගුණසේකර Paris France




# අයිස්ලන්තයත් ගිනිගනී නම්!



**ම**ම මේ සැරේ චන්දය දුන්නෙ **UK Green Party** එකට හෙවත් එක්සත් රාජධානියේ හරිත පක්ෂයට.

බ්‍රිතාන්‍ය මැතිවරණයේදි මම හැමදාම වගේ චන්දෙ දුන්නෙ ලේබර් පක්ෂයට. හැත්තෑ ගණන්වල ජේම්ස් කැලහැන්ගෙ රජය කාලෙ ඉඳලා, ටෝනි බ්ලෙයාර්ට වෙනකල් මැතිවරණ ගණනාවකදි මගේ චන්දය ලේබර් පක්ෂයෙන් පිට ගියේ නැහැ. ඒ එක්කම මම දැනගෙන හිටියා අපේ ශ්‍රීලාංකිකයො බොහෝ දෙනෙකුට හිත වැටිලා තිබුණෙ ඒ ලේබර් හෙවත් බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයට. කොන්සර්වේටිව් හෙවත් ටෝරි පක්ෂය ලංකාවෙ යූඇන්පී වගේ ධනපතින්ගෙ පාටිය හැටියටයි අපි කවුරුත් හඳුනගෙන හිටියෙ. ඒ නිසා අපේ චන්දෙ දුන්නෙ ලේබර් පාටියට.

මෙහෙම ඉන්නකොට ලෙබර්කාරයො බ්‍රිතාන්‍යයේ ඉන්න කොටි සංවිධානෙට පක්ෂ දෙමළ මිනිස්සුන්ගෙ අතකොළුවක් බවට පත්වුණා. ලිබරල් ඩිමෝක්‍රැට්කාරයොත් කොටින්ගෙ සාක්කුවට වැටුණා. මේ මෑතක කොන්සර්වේටිව් පක්ෂයත් දෙමළ අයගෙ අතකොළුවක් වෙලා ශ්‍රීලංකා රජයට බනින්න ගොරවන්න පටන් ගත්තා. මේ පක්ෂ තුනේම අයට සිංහළ පිරිස් ගිහිං කාරණා පැහැදිලි කරලා දුන්නත්, ඒ වෙලාවට "ඇත්තට අපි දැනං හිටියෙ නැනේ... හැබැ ද...? හරි අපිට දැන් තේරෙනවා ඇත්ත..." ඔය ආදී වචන කියලා සිංහළ කාණ්ඩෙ රවටලා යවලා පාර්ලිමේන්තුවට ගිහිං කොටි සංවිධානෙට පක්ෂවයි මේ හැම මන්ත්‍රියෙක්ම කතා කළේ. සෙනේට් මණ්ඩලයෙ ඉන්න නැසේබි සාමිවරයා විතරයි ත්‍රස්තවාදය පරාජය කිරීම ගැන ලංකා රජයට ප්‍රශංසා කළේ. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙ අනෙක් හැම එකෙක්ම ලංකා රජයට දොස් නගලයි කතා කළේ. තවමත් කතාකරන්නෙ.

මේ තත්වයට හේතුව තමයි කොටි සංවිධානය මේ පක්ෂ තුනම අල්ලගෙන ඒ මන්ත්‍රීවරුන්ගෙ ඡන්ද වැඩවලට සල්ලි වියදම් කිරීම. දෙමළ කණ්ඩායම් තමන්ගෙ වැඩ ඇරගෙන මේ මන්ත්‍රීලා වෙනුවෙන් ගෙවල් ගානෙ ගිහිං ප්‍රචාරක කටයුතු කළා. ඔය කාරණා නිසා චන්දෙ විතරක් නෙවෙයි අර විදියෙ සපෝට් එකකුත් තියෙන නිසා මේ පක්ෂ තුනේම අපේක්ෂකයො දෙමළ ඊළම වෙනුවෙන් කතා කරන්න පටන්ගත්තා. කොයි ලෝකෙත් දේශපාලකයා බලන්නෙ කොයි ක්‍රමයකින් හරි ආසනේ දිනන්න. තමන් වෙනුවෙන් ඡන්ද වැටෙනව නම් උන්ට ඕන එච්චරයි.

මේ කාරණා නිසා අපි හුඟ දෙනෙකුට බ්‍රිතාන්‍යයේ තියන දේශපාලනේ තිත්තයි. දැනට මේ රටේ ආර්ථිකය කඩා වැටිලා. සෞඛ්‍ය සේවාව අඩ පණවෙලා. සරණාගතයොයි, අපරාධකාරයොයි, ත්‍රස්තවාදියොයි, හැම කුණු ගොඩක්ම දැන් මේ රටට රිංගනවා. ඒවායේ කිසි පාලනයක් නෑ. විනය අන්තයටම පිරිහිලා. අධ්‍යාපනය පිරිහෙනවා. ඉස්කෝලවල ළමයි එකිනෙකාට පිහිවලින් අනිනවා. මේ සේරම මස්තබාල්දු දේවල් වෙද්දි මේ තකතිරු දේශපාලකයො අනික් රටවල් හදන්න යනවා. වෙන රටවල් වල කරන යුද්ධ වලට සම්මාදම් වෙනවා.

මම මුලින්ම සඳහන් කළා මම මේ සැරේ චන්දය දුන්නෙ **UK Green Party** එකට බව. ඒකට හේතුව මේකයි.

ග්‍රීන් පක්ෂය ඉතා අවංකවම බ්‍රිතාන්‍යයේ විතරක් නෙවෙයි මුළු මහත් ලෝකයේම පෘථිවියත්, පරිසරයත් ආරක්ෂාකරන්න කැප වෙච්ච අය. ඒ පක්ෂය ප්‍රාර්ථනා කරන්නෙ කිළිටි බවින් තොර, මනුෂ්‍යයන්ට පමණක් නොව, සියළුම සත්වයින්ට සුවසේ ජීවත්වන්නට හිතකර ලෝකයක් තනන එක. මට මෙතෙන්දි මතක් වෙනවා කරණීය මෙත්ත සූත්‍රය. "දිට්ඨා වා යෙව අද්දිට්ඨා... පෙනෙන සත්වයාද, නොපෙනෙන සත්වයාද, යේව දූරේ... වසන්ති අවිදූරේ... දුර සිටින දුත්වයාද, දුර නොවන සත්වයාද ආදී සියළු සතුන්ට මෛත්‍රීකරන්න..." පිරිත් පොතේ තියන බුද්ධ වචනය එහෙමයි. මේ සේරම දේවල් සිහියට අරගෙන මම ග්‍රීන් පක්ෂයෙ අපේක්ෂකයට කතිරය ගැහුවා. දිනන නොදිනන එක නෙවෙයි ප්‍රතිපත්ති වලට සැලකීම. ඒවා ලේබර්, කොන්සර්වේටිව්, ලිබ්ඩෙම් කාරයින්ගෙ ප්‍රෝඩාවල්වලට වැඩිය වටිනවා.

උඩම පින්තූරයෙ තියෙන්නෙ අයිස්ලන්තයේ පිපිරුණු ගිනිකන්දෙන් නැගුණු දුම. සතියක් පමණ ලෝකයේ සියළු ගුවන්ගමන් නැවතුණා. අයිස්ලන්තෙත් ගිනිගත්ත නම් අනිත් පැති ගැන අහන්න ඕනද? මායන්වරුන්ගෙ අනාවැකි අනුව **2012** දී මේ ලෝකෙ විනාසවෙනවා. මේ වෙසක් සමයේ මුළු මහත් ලෝකයා ම සිතේ ධාරණය කරගත යුතු සත්‍ය දෙය මෙපමණයි. එනම් **මේ ලෝකයේ කිසිවක් පවතින්නේ නැත.**

♦ වෙලේගෙදර රාළ London